# ප්‍රති ප්‍රබෝධා - 2026

## 5 ශ්‍රේණිය

5 ශ්‍රේණියේ සියලු දරුවන් සඳහා පැවැත්වෙන පෙරහුරු පරීක්ෂණය

( I පත්‍රය )

මෙය විභාගයක් නොවන අතර දරුවන්ගේ සාධන මට්ටම පරීක්ෂා කිරීම සඳහා පමණි.

විභාග අංකය :- .....

කාලය :- පැය 1යි

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් :

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු තුන බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.


**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක** ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි. | |
| | V/II/S |
| **දෙවන පරීක්ෂක** පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | |
| | V/II/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක** ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | |
| | V/II/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය. | |
| | V/II/S/CH |

- උතුරු මැද පළාත් ප්‍රාථමික අංශය -

1. පහත රූප අතරින් සමාන රූප යුගලය සහිත පිළිතුර තෝරන්න.



A B C D

i. BD ii. AC iii. CD

2. සම්බන්ධතාවය අඩුවෙන් ම දැක්වෙන පිළිතුරු ඇතුළත් කොටුව තෝරන්න.

| එළවළු / පලතුරු | පාන් / රොටී | අන්නාසි / කෙසෙල් |
|---|---|---|
| i. | ii. | iii. |

3.


| මේසන්හැන්ද<br>ලඹය | කියත<br>බුරුමය | කිණිහිර<br>අතංගුව |
|---|---|---|
| i. | ii. | iii. |

4. මෙම කවියේ අදහසට හොඳින් ම ගැළපිය හැක්කේ,

කුඹුරේ මැද සිටිනවා
සතුන් ව බිය කරනවා
වගාව අපෙ රකිනවා
අපට සතුට ගෙනෙනවා

i. කුඹුර ii. ගොවියා iii. පඹයා

5. මුලින් දී ඇති රූපය සකස් කිරීම සඳහා ABCD රූප අතරින් කුමන කොටස් දෙක යොදා ගත යුතු ද?



A B C D

i. AD ii. BD iii. BC

6. හිරු වලාකුළින් වැසෙයි - සුළං තදින් හමයි
පරිසරය අඳුරු වෙයි - ගතට සිසිලසක් දැනෙයි

මෙම සිදුවීම් පෙළට වඩාත් ම ගැළපෙන පිළිතුර වන්නේ,

i. වැසි සහිත අවස්ථාවකි. ii. වැස්සට පෙර අවස්ථාවකි. iii. වැස්සට පසු අවස්ථාවකි.

7. පහත රටාව අනුව ඊළඟට ආයුතු වචනය වන්නේ,

පස්සර ⟶ සඳගල ⟶ ගලපාත ⟶ පානදුර


i. නකල්ස් ii. දුම්බර iii. රම්බඩ

8. පහත සඳහන් ස්ථානවල පිහිටීම අනුව නිවැරදි පිළිතුර තෝරන්න.





i. පන්සලට නැගෙනහිරින් සහ කන්දට දකුණින් නිවස පිහිටා ඇත.
ii. වෙල්යායට බටහිරින් සහ වැවට දකුණින් පන්සල පිහිටා ඇත.
iii. කන්දට දකුණින් වැව ද නිවසට බටහිරින් වෙල්යාය ද පිහිටා ඇත.

9. මෙම රූපයේ අඩංගු චතුරස්‍ර ගණන කීය ද?



i. 5කි.
ii. 6කි.
iii. 7කි.

10. පහත දැක්වෙන රූපයේ අඳුරු කර ඇති කොටස් ගණන මුළු රූපයෙන් කීයෙන් පංගුවක් ද?



i. $\frac{4}{8}$ ii. $\frac{2}{8}$ iii. $\frac{3}{8}$

11. ගවයින් 6 දෙනෙකුගේ අං, කන්, පාද, ඇස් සහ වලිග එකතුවෙහි දෙගුණය කීය ද?


i. 66 ii. 122 iii. 132


12. තාත්තා ගෙනෙන ලද ඇපල්වලින් $\frac{1}{4}$ ක් නංගිට ද $\frac{1}{2}$ ක් මට ද ඉතිරිය මල්ලිට ද දුන්නේ ය. මල්ලිට ඇපල් ගෙඩි 8ක් ලැබුණේ නම් තාත්තා ගෙනෙන ලද මුළු ඇපල් ගෙඩි ප්‍රමාණය කොපමණ ද?


i. 35 ii. 32 iii. 30

13. පහත දැක්වෙන්නේ 1 සිට 6 තෙක් නිත් සංකේත යෙදූ ඝනකයකි. එය රූපයේ දැක්වෙන ආකාරයට ම A කොටුව මත තබා ඊතලය දැක්වෙන දිශාවට පෙරළුවේ නම් C අවස්ථාවට ගැළපෙන රූපය තෝරන්න.


A රූපය






i.



ii.



iii.


14. කිසියම් සිදුවීමක අවස්ථාවන් හතරක් පහත දැක්වේ.

| A | B | C | D |
|---|---|---|---|
| අස්වනු නෙළනවා | ඵලදාව හැදිලා | බීජ පැළ කරනවා | පැළ වර්ධනය වී ඇත |


එම සිද්ධි අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

i. BDCA ii. CBDA iii. CDBA


15. පහත රටාවේ හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.




i. 7





ii. 8





iii. 9

16. මුලින් දී ඇති රූපය සමචතුරස්‍රාකාර රූපයක් ලෙස සැකසීමට දී ඇති පිළිතුරු අතරින් රූප දෙකක් අවශ්‍ය වේ. එම සමචතුරස්‍රය සෑදීමට අවශ්‍ය නොවන රූපය ඇතුළත් පිළිතුර තෝරන්න.






i.



ii.



iii.


17. රටාව හඳුනාගෙන හිස් කොටුවට ගැළපෙන පිළිතුර තෝරන්න.

426 ⟶ 48 i. 67

345 ⟶ 39 ii. 76

625 ⟶ ☐ iii. 26

18. පහත රූප එක මත එක තබා ඇති ආකාරය බලා ? ඇති ස්ථානයට ගැළපෙන පිළිතුර තෝරන්න.






?

i. 

ii. 

iii. 

19. පහත රූපයේ ඇති ගණක ගණන කීය ද? ( බිත්තියේ මුල්ලක හේත්තු කර තබා ඇති ගණක සමූහයකි.)



i. 10


ii. 6


iii. 18


20. මවගේ සහ දුවගේ වයස්වල එකතුව අවුරුදු 40කි. දුවගේ වයස මවගේ වයසින් $\frac{1}{4}$ කි. ඒ අනුව මවගේ වයස කීය ද?

i. අවුරුදු 30 ii. අවුරුදු 25 iii. අවුරුදු 32

21.




මේ අනුව ඇපල් ගෙඩියක මිල වන්නේ,

i. රු. 20.00 ii. රු. 30.00 iii. රු. 25.00


22. භාජනයක ඇති සීනිවලින් 300g ක් ඉවත් කර ඉතිරි සීනි ප්‍රමාණය භාජන තුනකට සමාන ව දමන ලදි. එම එක් භාජනයක ඇති සීනි ප්‍රමාණය 250gක් නම් විශාල භාජනයේ තිබූ සීනි ප්‍රමාණය කොපමණ ද?

i. 1kg 500g ii. 1kg 50g iii. 1kg 200g

23. තේ කෝප්ප 18ක් සෑදීමට තේකුඩු 50g ක් අවශ්‍ය වේ. තේ කෝප්ප 90ක් සෑදීමට අවශ්‍ය තේකුඩු ප්‍රමාණය කොපමණ ද?

i. 150g ii. 350g iii. 250g


24. පහත සැමන් ටින් ගොඩෙහි හිස්තැනට ආයුතු සැමන් ටින් ප්‍රමාණය කොපමණ ද?



.....

i. 28 ii. 21 iii. 24

25. පළමු රූපයට අනුව දී ඇති රූප අතරින් **නොගැළපෙන** රූපය තෝරන්න.



i. ii. iii.

26. පහත දැක්වෙන්නේ එක්තරා සිදුවීමක අවස්ථා කීපයකි. එම සිදුවීම් නිවැරදි පිළිවෙළට දක්වා ඇති පිළිතුර තෝරන්න.

A - තාත්තා සමන්ට බයිසිකලයක් ගෙනත් දෙයි.

B - සමන් හොඳින් විභාගයට මුහුණ දෙයි.


C - විභාගය සමත් වූ විට බයිසිකලයක් ගෙනත් දෙන බව තාත්තා පවසයි.

D - සමන් විභාගය ඉහළින් ම සමත් වෙයි.

E - සමන් මහන්සි වී පාඩම් කරයි.

i. EBDAC ii. BEDAC iii. CEBDA

27.




P < Q > R < P

අඩුයි < වැඩියි

වැඩියි > අඩුයි

ඉහත PQR ලෙස ඇඳ ඇති සැමන් ටින් තුනක උස ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු ඉදිරියෙන් දැක්වේ.


PQR ටින් තුන උස වැඩි ටින් එකේ සිට උස අඩු ටින් එක දක්වා පිළිවෙළින් ලියා ඇති පිළිතුර කුමක්ද?

i. QPR ii. RQP iii. PQR

28. පහත දී ඇති ද්‍රව්‍යවලින් පළමුවැන්න සකස් කිරීමට දෙවැන්න අත්‍යවශ්‍ය නොවන වචන යුගලය තෝරන්න.

i. තේ - ජලය ii. හාල් - වී iii. ව්‍යංජන - පොල්

29. ගොවිපළක ගොවිමහතෙකු තම පලතුරු වගා කටයුතු කොටස්වලට බෙදා වගා භූමියක් සකස් කළ ආකාරය පහත දැක්වේ.




ඉහත ගොවිපළේ සෑම වගාවක් වටේට ම ලණු ඇද වෙන් කරන ලදි. ඒ සඳහා අවශ්‍ය වන ලණුවල දිග ප්‍රමාණය කොපමණ ද?

i. 150m ii. 285m iii. 350m


30. පහත වාක්‍යයේ හිස්තැන්වලට ගැළපෙන නිවැරදි වචන සහිත පිළිතුර තෝරන්න.

..... අයිනේ නියරේ ඉඳන් ..... බලා සිටින .....


පැටව් අල්ලන් කන මම පක්ෂියෙකි.

i. වනය, සිනාසෙමින්, ඉබ්බා ii. ළිඳ , උඩ , ගෙම්බා iii. ඇළ , විමසිල්ලෙන්, තිත්ත


31. පහත රූප අතරින් සම්මිතික අක්ෂ 3ක් පමණක් ඇඳිය හැකි රූපය තෝරන්න.



i.




ii.




iii.


32. පහත සඳහන් රූප අතරින් කැඩපතකින් බැලූ විට නොවෙනස් ව පෙනෙන රූපය කුමක් ද?

i.





ii.




iii.

33. නිවැරදි පිළිතුර තෝරන්න.

ආචාරියා ⟶ පිහිය නම් සපත්තේරුවා ⟶ ?

i. පිහිය ii. පොත iii. සෙරෙප්පුව

34. මෙම රූපයේ ඇති සරල රේඛා ගණන කීයද?




i.10

ii. 9

iii. 8


35. පහත දී ඇති හැඩය නොවෙනස් ව තිබිය දී සමචතුරස්‍රයක් බවට පත් කිරීම සඳහා සම්පූර්ණ කළයුතු අඩු ම කොටු සංඛ්‍යාව කීයද?




i. 12

ii. 14

iii. 10


36.  ..... මෙම රටාවට අනුව හැඩතල පිළිවෙළින් ගත්විට 31 වන හා 35 වන හැඩතල වන්නේ,

i. 

ii. 

iii. 


37. පහත රූපයෙහි පාට කළ කොටස මුළු රූපයෙන් කීයෙන් පංගුවක් ද?



i. $\frac{5}{8}$ ii. $\frac{2}{4}$ iii. $\frac{3}{4}$

➢ ඉදිරියෙන් දැක්වෙන්නේ සංකේත මගින් අගයන් දක්වා ඇති අවස්ථාවකි.

38. මෙහි  හි අගය විය හැක්කේ,





i. 1 ii. 3 iii. 5

39.  අගය වන්නේ,

i. 5 ii. 3 iii. 9

40. පහත දැක්වෙන්නේ කොටු ජාලයක් තුළ ඇඳ ඇති හැඩතල 3කි.



මෙම හැඩතල අතරින් විශාල ම හැඩතලය කුමක් ද?

i. චතුරස්‍රය

ii. වෘත්තය

iii. ත්‍රිකෝණය

# ප්‍රති ප්‍රබෝධා - 2026

## 5 ශ්‍රේණිය

5 ශ්‍රේණියේ සියලු දරුවන් සඳහා පැවැත්වෙන පෙරහුරු පරීක්ෂණය

( II පත්‍රය )

මෙය විභාගයක් නොවන අතර දරුවන්ගේ සාධන මට්ටම පරීක්ෂා කිරීම සඳහා පමණි.

විභාග අංකය :- .....

කාලය :- පැය 1 මිනිත්තු 15යි

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් :

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60ක් ඇත. සමහර ප්‍රශ්නවල අනු කොටස් ද ඇත.
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- පිළිතුරු ලියන ලෙස උපදෙස් දී ඇති ප්‍රශ්නවලට තිත් ඉරි මත පිළිතුරු ලියන්න.
- පිළිතුරට යටින් ඉරක් අඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක** ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි. | |
| | V/II/S |
| **දෙවන පරීක්ෂක** පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | |
| | V/II/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක** ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | |
| | V/II/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය. | |
| | V/II/S/CH |

- උතුරු මැද පළාත් ප්‍රාථමික අංශය -

1. පහත ඡේදය හොඳින් කියවන්න.

"වැස්ස නැති හැමදාක ම ලොකු අම්මා පොල් ලෙලි තැළීමට ගියා. තළන ලද ලෙලි, කොහු වුණාට පසු ලොකු අම්මා ඒවා ගෙනැවිත් මිදුලේ දමා වේළා ගත්තා. වේළුණු කොහු නෙළීමෙන් ඇ මිදුල මැද රන්වන් කොහු වලාකුළක් සදා ගත්තා. ඒ වලාකුළේ මා පෙරළි පෙරළි සෙල්ලම් කළේ පුසි පැටවකු මෙන් නිදහසේ. වෙලාවකට මට හිතුණා ඒ රන්වන් කොහු, යෝධ සීයා කෙනෙකුගේ රැවුළක් දෝ කියලා."

- ඡේදය ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

i. ලොකු අම්මා පොල් ලෙලි තැළීමට යන්නේ කවර දිනවල දී ද?

.....

ii. තළන ලද ලෙලි ගෙනත් දමන ස්ථානය කුමක්ද?

.....

iii. වේළුණු කොහු නෙළීමෙන් ඇ සාදා ගත්තේ කුමක්ද?

.....

iv. කොහු වලාකුළේ සෙල්ලම් කළ ආකාරය ඡේදයේ සඳහන් ව ඇත්තේ කෙසේද?

.....

v. ඡේදයේ සඳහන් මහප්‍රාණ අක්ෂරයක් සහිත වචනය ලියන්න.

.....

02. වැරදි අක්ෂර වින්‍යාසය සහිත වචන දෙක තෝරා එය නිවැරදි කර පහත හිස්තැන මත ලියන්න.

"සමනල්ලු මල්පැනි බීමට මලින් මලට පියඹා යති."

(i) ..... (ii) .....

03. පහත සඳහන් එක් එක් වගන්තියේ උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය නිවැරදි නම් (√ ) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද වරහන තුළ යොදන්න.

i. ගිරවු ගස් බෙනයක ජීවත් වෙති. ( )

ii. ඔහු ගමට ගියා ය. ( )

iii. ගස් සුළඟට වැනෙයි. ( )

iv. අපි මල්පැළවලට වතුර දමමි. ( )

04. සුදුසු යුගල පද යොදා පහත වැකිය සම්පූර්ණ කරන්න.

දවස පුරා ම ..... වල නිරත වූ දරුවන්ට අම්මා ..... වලින් සංග්‍රහ කළා ය.

( කෑම බීම/ යාන වාහන / අහල පහල / කෙළි සෙල්ලම් )

05. ඡේදය හොඳින් කියවා එහි සඳහන් නාමපද ඇසුරින් පහත වගුව පුරවන්න.

"ඉරිදා උදැසන අම්මා පොළට යාමට සූදානම් වූවා ය. ඇය යතුරු පැදියට නගිනු දුටු බලු පැටියා වලිගය වනමින් ඉදිරියට පැමිණියේ සතුටිනි."

| පුද්ගල නාම | සත්ත්ව නාම | ස්ථාන නාම | ද්‍රව්‍ය නාම |
|---|---|---|---|
| | | | |

06. පහත සඳහන් වැකි බහු වචනයට හරවා ලියන්න.

i. මම උදෙන් ම අවදි වෙමි. - .....

ii. ඔහු ගමට ගියේ ය. - .....

07. පහත වැකි කියවා සුදුසු විරාම ලකුණු යොදන්න.

i. රබානෙන් වාදනය කරන පද රබන් පද ලෙස හැඳින්වේ

ii. ඔබ මේ ගසේ ගෙඩි අනුභව නොකළේ ඇයි

08. පහත සඳහන් වචන නිවැරදි ව ගළපා අර්ථවත් වැකියක් ලියන්න.

ඇඳුම් / බයෙන් / ළමයි / වෙරළට / තෙමෙනැයි / දුවති

.....

09. පහත වැකිවල ඉරි ඇඳි පදවල ස්ත්‍රීලිංග පදය හිස්තැන මත ලියන්න.

i. සතුන් වත්තේ කූඩුවක සිටි <u>කොටියා</u> දෙස ළමයා බලා සිටියි. - .....


ii. <u>යහළුවා</u>ගේ පොත අතැතිව ඉසුරි ඉක්මනින් පැමිණෙයි. - .....

10. සුදුසු පරිදි ප්‍රස්තාව පිරුළ සම්පූර්ණ කරන්න.

i. කටුස්සාගේ කරේ .....

ii. ..... කැඳ හැළිය වගේ.

11. පහත රූපවල නම ඉංග්‍රීසි අකුරින් ලියන්න.

i.  .....

ii.  .....

12. පහත වචන නිවැරදි ව ගළපා අර්ථවත් වැකියක් සාදන්න.

i. name / My / Nethusha / is - .....

ii. is / this / a / parrot - .....

13. පහත දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.


වංගි - .....

14. පහත සඳහන් වැකියේ දෙමළ උච්ඡාරණය සිංහල අකුරින් ලියන්න.

ඔබේ නම කුමක්ද? .....

15. i. ගණක රාමුවේ නිරූපිත සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.

.....




ii. පහත දී ඇති සංඛ්‍යාවේ නාමය ලියන්න.

7085 - .....

16. i. පහත සඳහන් සංඛ්‍යා ආරෝහණ පටිපාටියට සකස්කර ලියන්න.

4762 , 4890, 4756 - .....

ii. පහත සඳහන් සංඛ්‍යා අවරෝහණ පටිපාටියට සකස් කර ලියන්න.

3085 , 3980 , 2670 - .....

17. කර්මාන්ත ශාලාවක් එක් දිනක දී කමිස 1156 ක් ද කලිසම් 838 ක් ද නිෂ්පාදනය කරන ලදි.

i. එදින කර්මාන්ත ශාලාව නිපද වූ කමිස හා කලිසම් සංඛ්‍යාව කොපමණ ද? .....


ii. එදින නිෂ්පාදනය කරන ලද කමිස හා කලිසම් සංඛ්‍යාවේ වෙනස කොපමණ ද? .....

18. සබන් කැට 416ක් පෙට්ටි 4කට සමාන ව අසුරන ලදි. එවිට එක් පෙට්ටියකට දමන ලද සබන් කැට ගණන කොපමණද? .....

19. එක් පැකට්ටුවක පැන්සල් 5ක් ඇත. එවැනි පැකට්ටු 123ක ඇති මුළු පැන්සල් ගණන කොපමණද?

.....


20. පාසලක ප්‍රාථමික අංශයේ විවිධ ප්‍රසංගය පෙ.ව.9.00ට ආරම්භ වී පෙ.ව.11.30ට අවසන් වූයේ නම් විවිධ ප්‍රසංගය පැවැත් වූ කාලය කොපමණද? පැය ..... මිනිත්තු .....

21. 


මෙම රූපයේ ඇති මාළු ගණන රෝම ඉලක්කමෙන් ලියන්න.

.....

22. පහත සඳහන් ඝනවස්තුව ඇසුරින් වගුව පුරවන්න.



| දාර | ශීර්ෂ |
|---|---|
| | |

23. 


වට්ටක්කා ගෙඩියේ සැබෑ බර කොපමණද?

..... kg ..... g

24. පහත සඳහන් සංඛ්‍යාව ස්ථානීය අගය අනුව විහිදුවා ලියන්න.

5403 = ..... + ..... + ..... + .....


25. අම්මා කැවිලි සෑදීමට ගෙනෙන ලද පොල්තෙල් 2 l 500mlකින් කැවිලි සෑදීමෙන් පසු පොල්තෙල් 1 l 100mlක් ඉතිරි වී තිබුණේ නම්, කැවිලි සෑදීමට වැය වූ පොල්තෙල් ප්‍රමාණය කොපමණද? .....

26. වන්දනා ළඟ 1m 80cmක් දිග රිබන් පටියක් ද උමන්දා ළඟ 2m 15cmක් දිග රිබන් පටියක් ද ඇත.

දෙදෙනා ළඟ ම ඇති රිබන් පටිවල දිග කොපමණද? .....m .....cm


27. ඉදිරියෙන් දී ඇති රූපයේ සමමිතික රේඛා සියල්ල ඇඳ පෙන්වන්න.



28.  මෙම රූපයෙන් $\frac{1}{4}$ ක කොටසක් පාට කරන්න.

29. පහත ප්‍රස්තාරය ඇසුරින් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

➢ පන්තියක සිසුන් කැමති මල් වර්ග පිළිබඳ තොරතුරු පහත ප්‍රස්තාරයේ දැක්වේ.




i. ඕකිඩ් මලට කැමති සිසුන් ගණන අරලිය මලට කැමති සිසුන් ගණන මෙන් දෙගුණයක් නම් එය ප්‍රස්තාරයේ ලකුණු කරන්න.

ii. වැඩි ම සිසුන් ප්‍රමාණයක් කැමති මල් වර්ගය කුමක්ද?

.....

අංක 30 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.

30. තම රටට ආදරය දැක්විය හැකි ආකාරයකි.

i. ආගමික වතාවත් දිනපතා සිදුකිරීම
ii. වැඩිහිටියන්ට ගරු කරමින් කතා කිරීම
iii. අප අවට පරිසරය සුරකින්නෙකු ලෙස කටයුතු කිරීම

31. පොදු ස්ථානයක දී වැරදි ලෙස හැසිරෙන අවස්ථාවක් වන්නේ,

i. රෝහලක ප්‍රතිකාර ලබා ගැනීමට යාමට තම වාරය එන තුරු රැඳී සිටීම
ii. දුම්රියේ ප්‍රවේශපත්‍ර නොගෙන ගමන් කිරීම
iii. පොදු ප්‍රවාහන බස් රථයක ශබ්ද නඟා දුරකතන සංවාදයක යෙදීම

32. යම් කාර්යක් නියමිත කාලයක් තුළ ඉටුකිරීමෙන් වන වාසියක් වන්නේ,

i. මානසික පීඩනයක් ලැබීම ii. අන් අයගේ ප්‍රසංසාව ලැබීම iii. කාලය වැඩිපුර වැයවීම

33. ජාතික ගීය ගායනා කරන විට පවත්වා ගතයුතු නිවැරදි ඉරියව්වක් වන්නේ,

i. කඳ ඍජුව තබා සිරුවෙන් සිටීම
ii. පහසුවන් සිටීම
iii. අත් සහ පාද පහසු ආකාරයට තබා ගැනීම

34. ජාතික කොඩියේ දක්නට ලැබෙන සංකේත දෙකකි.

i. කහ පැහැති සිංහ රූපය සහ පුන්කලස
ii. කඩුව අතින් ගත් සිංහ රූපය සහ බෝපත් හතර
iii. ධර්ම චක්‍රය සහ බෝපත් හතර

35. බෞද්ධ හා හින්දු ආගමික බැතිමතුන් පවත්වන පෙරහැර දෙකක් පිළිවෙළින්,

i. මිහිදු පෙරහැර සහ දළදා පෙරහැර
ii. වේල් පෙරහැර සහ දළදා පෙරහැර
iii. දළදා පෙරහැර සහ වේල් පෙරහැර

36. අවුරුද්දේ එක් කාලයකට පමණක් මල් පිපෙන ශාක වන්නේ,

i. පොල් , ඇහැළ , බිනර  ii. ඇහැළ , එරබදු , රඹුටන්  iii. අඹ , ඇහැළ , කෙසෙල්

37. ශාක පත්‍ර යොදා ගෙන කුඩු සාදා ගන්නා සතුන් **නොවන්නේ,**

i. දිමියා , පැණි කුරුල්ලා  ii. කපුටා , කොකා  iii. වඩු කුරුල්ලා , දිමියා

38. සතුන්ගෙන් ශාකවලට සිදුවන අයහපතක් වන්නේ,

i. ශාක කොටස් කෑ දැමීම
ii. මල්වල පරාගනය සිදුවීම
iii. ශාකවල බීජ විවිධ ස්ථානවලට රැගෙන ගොස් දැමීම

39. ශාකයක මල්, ගෙඩි, පත්‍ර ආහාරයට ගන්නා ශාක වර්ග පිළිවෙළින්,

i. ගෝවා, මුකුණුවැන්න, මුරුංගා
ii. කතුරුමුරුංගා, ගොටුකොළ, අඹ
iii. කෙසෙල්, කැකිරි, ගොටුකොළ

40. මලක කොටස් පමණක් අඩංගු පිළිතුර වන්නේ,

i. පත්‍ර, නටුව, දල්ල  ii. නටුව, ඩිම්බකෝෂ, රේණු  iii. මුල්, රේණු, පත්‍ර

41. සතුන්ගේ පැවැත්මට හානිකර මිනිස් ක්‍රියාකාරකම් වන්නේ.

i. ගස් කැපීම, ගිනි ගොඩවල් ගැසීම
ii. කැලෑ එළිකිරීම, සතුන්ට වාසස්ථාන සාදා දීම
iii. ගස් වැවීම, ගිනි ගොඩවල් ගැසීම

42. මනිස්ලැල්ල, බුරුමය හා වීසිදැල භාවිත කරන ඈත්තින් පිළිවෙළින්,

i. ධීවර, වඩු, පෙදරේරු  ii. පෙදරේරු, වඩු, ධීවර  iii. පෙදරේරු, ධීවර, වඩු

43. භාණ්ඩ හා උපකරණ නිවැරදි පරිහරණයෙන් හා නඩත්තුවෙන් ලැබෙන වාසියකි.

i. භාණ්ඩ හා උපකරණ සඳහා නිතර නිතර මුදල් වැයවීම
ii. භාණ්ඩ හා උපකරණ ඉක්මනින් අබලං වීම
iii. දීර්ඝ කාලයක් භාවිත කළ හැකි වීම

44. නිෂ්පාදිත දිනය හා කල් ඉකුත්වීමේ දිනය අතර අඩු දින ගණනක් ඇත්තේ,

i. බිස්කට් වර්ගවල  ii. මුදවපු කිරිවල  iii. චොකලට් වර්ගවල

45. පෝෂ්‍යදායී ආහාර වේලක අඩංගු විය යුත්තේ,

i. එළවළු, පලතුරු, පලා වර්ග, ධාන්‍ය වර්ග

ii. රසකාරක යෙදූ ක්ෂණික ආහාර

iii. කෘත්‍රිම වර්ණ යෙදූ තෙල් අධික ආහාර

46. රෝග වාහක මදුරුවන් දෂ්ඨ කිරීමෙන් වැළදෙන රෝග පමණක් අඩංගු පිළිතුර වන්නේ,

i. ඩෙංගු, අතීසාරය, මැලේරියාව ii. ඩෙංගු, පැපොල, පාචනය iii. ඩෙංගු, බරවා, මැලේරියාව

47. ස්වභාවික් අනතුරක් සහ මිනිස් ක්‍රියාකාරකම් නිසා සිදුවන අනතුරක් පිළිවෙළින් ඇති පිළිතුර වන්නේ,

i. අකුණු සැර වැදීම, රිය අනතුරු ii. දියේ ගිලීම, නායයාම iii. ගංවතුර ගැලීම, ගස් කඩා වැටීම

48. ජලය දූෂණය වන අවස්ථාවක් වන්නේ,

i. ඉහිනි ඇට ජලයට දැමීම

ii. පලිබෝධනාශක, රසායනික පොහොර ජලයට මුසුවීම

iii. ගංගා හරස්කර ඇළ මාර්ග සෑදීම

49. පිරිසිදු ජලය සම්බන්ධ **වැරදි** ප්‍රකාශය වන්නේ,

i. ජලය, දමන භාජනයේ හැඩය ගනී

ii. රත්කළ විට ජලය වාෂ්ප වෙයි

iii. පිරිසිදු ජලයට රසයක් ඇත

50. ගොඩබිම, ජලයේ හා ගුවනේ ගමන් කරන වාහන පිළිවෙළින් සඳහන් පිළිතුර වන්නේ,

i. බස් රථය, බෝට්ටුව, ගුවන්යානය

ii. නැව, කරත්තය, ත්‍රිරෝද රථය

iii. රොකට්ටුව, පාපැදිය, පාරුව

51. පොදු ප්‍රවාහන සේවයේ ආසන වෙන් කර ඇති අය පමණක් වන්නේ,

i. පූජ්‍ය පක්ෂය, ළදරුවන්, ආබාධිත අය

ii. ගැබිනි මව්වරුන්, ආබාධිත අය, පූජ්‍ය පක්ෂය

iii. පූජ්‍ය පක්ෂය, වැඩිහිටියන්, ආබාධිත අය

52. ගෙවතු වගාවේ දී රසායනික පොහොර භාවිතයේ **අවාසියක්** වන්නේ,

i. වැඩි අස්වැන්නක් ලබා ගැනීම

ii. වගාව සරුසාර වීම

iii. පාංශු ජීවීන්ට අහිතකර වීම

53. උතුරු මැද පළාතට අයත් දිස්ත්‍රික්ක වන්නේ,

i. අනුරාධපුරය, පොළොන්නරුව ii. අනුරාධපුරය, කැකිරාව iii. කුරුණෑගල, තඹුත්තේගම

54. අපට දිවා රෑ ඇතිවන්නේ,

i. සූර්යයා භ්‍රමණය වන නිසා

ii. පෘථිවිය භ්‍රමණය වන නිසා

iii. චන්ද්‍රයා පෘථිවිය වටා ගමන් කරන නිසා

55. "අහසින් වැටෙන එක ජල බිඳුවක් හෝ අපතේ නොයවා ප්‍රයෝජනයට ගන්න." යන ප්‍රකාශය කළ රජතුමා වන්නේ,

i. ධාතුසේන රජතුමා ii. මහා පරාක්‍රමබාහු රජතුමා iii. දුටුගැමුණු රජතුමා

56. අපට නොමිලේ සේවා සපයන ආයතනයකි.

i. රජයේ රෝහල ii. විදුලිබල මණ්ඩලය iii. ජල සම්පාදන මණ්ඩලය

57. කොම්පෝස්ට් පොහොර සාදා ගැනීමට යොදා නොගන්නා ද්‍රව්‍ය වන්නේ,

i. ශාක පත්‍ර, එළවළු පොතු වර්ග

ii. වියළි ශාක පත්‍ර, එළු පොහොර

iii. පොලිතීන්, ප්ලාස්ටික්

58. ශ්‍රී ලංකාවේ මුල් ම තේ ගස පිහිටියේ,

i. ගම්පහ හෙනරත්ගොඩ උද්‍යානය

ii. පේරාදෙණිය උද්භිත උද්‍යානය

iii. හග්ගල උද්භිත උද්‍යානය

59. විද්‍යුත් චුම්භකයක් නිර්මාණය කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය පමණක් අඩංගු පිළිතුර වන්නේ,

i. බැටරිය, වයර් කැබැල්ල, චුම්භකය

ii. බැටරිය, යකඩ ඇණය, චුම්භකය

iii. බැටරිය, කොයිල් කම්බිය, යකඩ ඇණය

60. "මගේ රට" යන මාතෘකාව යටතේ වාක්‍ය 3ක් ලියන්න. සෑම වැකියක් ම වචන පහකට නොඅඩු විය යුතුයි. උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුය.

1. .....

.....

2. .....

.....

3. .....

.....